යටතේ ඉගෙන ගන්නවා....

ශ්‍රීනාත්
කව්ද මේවට උදව් කරන්නෙ....?
රසිකා
මට හැම දේකටම පිටිපස්සෙන් ඉඳලා උදව් කරන්නෙ මගේ ස්වාමියා අරුණ කුලසිංහ

ශ්‍රීනාත්
විවාහ වුණේ මොන අවුරුද්දෙද?
රසිකා
1995 දි... මට දිල්ෂාන් සහ මදුෂාන් කියලා දරුවන් දෙන්නෙක් ඉන්නවා... ඒ අ යත් නැටුම් වලට කැමතියි...

ශ්‍රීනාත්
දෙමාපියන් ගැන යමක් කිව්වොත්...
රසිකා
අම්මා හේමමාලි විජේගුණවර්ධන. තාත්තා විජය ගුණවර්ධන.. අයියා ඉන්දු අක්කා ඉන්දිකා තාත්තා රැකියාව කළේ පොලීසියේ ඔහුට උවමනාව තිබුණා මාවත් පොලිස් තූර්යවාදක කණ්ඩායමට ඇතුල් කරන්න නමුත් මම ඒකට කැමති වුණේ නැහැ

ශ්‍රීනාත්
ලංකාවෙදි නර්තන තරග වලට ඉදිරිපත් වෙලා නැද්ද?
රසිකා
වෙලා තියෙනවා... අන්තර් විද්‍යාල නැටුම් තරග වලින් ජය ලබලා තියෙනවා... ජාතික තරුණ සේවා සභාවේ යෞවන සම්මාන උළෙලේ දී 1990 නව නිර්මාණ නැටුම් ඒකල ප්‍රථම ස්ථානය දිනා ගත්තා... ජන නැටුම් දෙවන ස්ථානය දිනාගත්තා... 1991 උඩරට නැටුම් හා බෙර වාදන වෙනුවෙන් ප්‍රථම ස්ථානය දිනාගත්තා... යෞවන සමාජ සහ ප්‍රදේශීය තරග විශාල සංඛ්‍යාවකින් ජය ගෙන තියෙනවා...

ශ්‍රීනාත්
ඔබට උදව් කළ අය කව්ද?
රසිකා
එඩ්මන්ඩ් ගනේගොඩ සහ වෙලබඩ සුමතිපාල බෝධිපක්ෂ මුදියනසේ දිසා-නායක වෛද්‍යවතී රාජපක්ෂ පියසාර ශිල්පාධිපති රජිනි සෙල්වනායගම් ඇතුලු විශ්ව විද්‍යාලයේ හිටපු සියලු ආචාර්යවරු... මුල්ම නැටුම් ගුරුවරිය වන ප්‍රියා ගුණවර්ධන... තවත් හුගක්අය ඉන්නවා...

ශ්‍රීනාත්
අනාගත බලාපොරොත්තු
රසිකා
මම දන්න ශිල්පය මෙහි වෙසෙන ළමයින්ට බෙදා දීම තමයි මගේ එකම අරමුණ...

ශ්‍රීනාත්
නැටුම් වලට ළමයින්ගේ සහභාගිත්වය කොහො මද?
රසිකා
ළමයි ඉතා උනන්දුවෙන් ආසාවෙන් ඉගෙන ගන්නවා... නමුත් පිරිමි ළමුන් නැටුම් ඉගෙනගන්න එනවා අඩුයි... මේ කලාව ගැහැනු ළමයින්ට විතරක් සීමා වුණ කලාවක් නෙවෙයි... වෙස් නැටුම් හා උඩරට නැටුම් ශ්‍රී ලාංකික අපටම ආවේනික නැටුම් බව ලොකයේ හැම දෙනෙක්ම පිලිගන්නවා... වෙස් නැටුම අපේ උරුමයක්... වෙස් බඳින්න පිරිමි ළමයි ඉන්න ඕනෙ...

අපේ සාකච්ඡාව යන අතරේ තවත් ළමුන් කණ්ඩායමක් නැටුම් පුහුණුවට ඇතුල් වුණා. මම කාලවේලා නොගෙන ඇගෙන් සමුගත්තා. විශ්ව නර්තන රේඛා ප්‍රසංගය සියලු දෙනාටම නැවුම් අත්දැකීමක් වන බව විශ්වාසයි.

ඇගේ ලිපිනය
20 Khalil Av
Dandenong Vic
Australia





